# අනන්තය



ආචාර්ය
**වික්‍රමබාහු කරුණාරත්න**

ඉංදියාව සංවර්ධනයේ ඉහළට ගිය රටක් හැටියට හඳුන්වනවා. ඉංදියාව, රුසියාව, චීනය දකුණු අප්‍රිකාව හා බ්‍රසීලය මෙලෙසට අලුත් ගෝලීය බලවතුන් හැටියට සලකනවා. එම රටවලට දැන් කියන්නේ BRICS රටවල් කියලයි. එම රටවල්වල මුල් අකුරු එකතු කරලයි ඒ වචනය හදල තියෙන්නේ. යුරෝ පයේ පැරණි ධනපති බලවතුන්ටත් වඩා මේ අය බලසම්පන්න හැටියට සමහරු සලකනවා. ඒ වුණත් මේ හැම රටකම ඇතුළත ඇති නැති පරතරය බරපතලයි.

රුසියාව නම් තරමක් දුරට අනෙක් ධනපති රටවල් වගේ පරණ සමාජ වටපිටාව බිඳ දමපු රටක් හැටියට සලකන්න පුළුවන්, 1917 කාලේදීම ධනපති

***තාෂ්ණාවේ මෙහෙයුමෙන් සංවර්ධනය ගෙන යාම ගැන කථා කරන උදවිය හිට්ලර්ලා කළ දේ ගැන කථා කරන්නේ නැහැ. සංවර්ධනය ඇති කළ පළියට සමාජ පිරිහීම පිළිගන්න බෑනේ.***

ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු ඉටු කරපු රටක් හැටියට එය ඉදිරියට ආපු නිසා. චීනයේ ඒ වගේ විප්ලවකාරී වෙනස්කම් සිදු වුණාත් අලුත් වැඩපිළිවෙල උඩ පිටිසර පළාත් හුඟක් පහළ මට්ටමට වැටිල කියලයි තොරතුරු එළිවෙන්නේ. මොකද? එදා වගේ නෙවෙයි අද ධනපති සංවර්ධනය ඇති කරන්නේ බහුජාතික සමාගම් නිසා. එම සමාගම් තුළින් මනුස්ස යථාර්ථය සැලකිල්ලට ගැනීමක් සිදු නොවන බව දැන් ධනපති වියතුන්ම කියන්නට පටන් අරන්. තෘෂ්ණාවෙන් ධනය ගොඩගසා ගැනීමෙන් දියුණුවට මුල්වෙන ආයෝජන ඇති වෙනව කියන එක හැම විටම ඇත්ත නෙවෙයි. බහුජාතික සමාගම්වල තෘෂ්ණාවේ මෙහෙයුම දූෂණයට, නිර්මාණ මැරීමට හේතු වන බව දැන් ධනපති වියතුන්ම කියන්න පටන් අරන්. මේ අනුව නූතන තාක්ෂණය යොදමින් ඇති කරන ආයෝජන හා සංවර්ධනයෙන් මිනිස් සමාජයට අහිතකර තත්ත්වයක් උදා කරන්න පුළුවන්. මේකේ ඇත්ත හොඳට පෙනෙනවා පරිසරයට වෙන විනාශයෙන්. සතුන්ට, ගස්කොළන්වලට පමණයි මේ හිරිහැර කියල හිතන අයට දැන් පේනවා කොයි තරම් දුරට සමහර ආයෝජන මිනිසාගේ පැවැත්මට විනාශකාරීද කියල.

අනෙක් ප්‍රශ්නය තමා ප්‍රජාතන්ත්‍රවාදය. හුඟ දෙනෙක් ප්‍රජාතන්ත්‍රවාදය කිව්ව ගමන් හිතන්නේ මැතිවරණ ගැන. ඒකත් වැදගත් පැත්තක් තමයි. දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය වගේම නැත්නම් ඊටත් වඩා වටිනවා සමාජ ප්‍රජාතන්ත්‍රවාදය. පැරණි සමාජවල කුල ක්‍රමය තිබුණා. වර්ග ක්‍රම තිබුණා. ඒ අනුව ඒ ඒ කුල නැත්නම් වර්ග කටයුතු කරන ආකාරය ගැන රාමුවක් තිබුණා. මේ දේවල් වෙනස් කරල හැම මිනිසෙක්ම එකම ලෙසට සමාජ ගත කිරීම වැදගත් ප්‍රජාතන්ත්‍රවාදයක්. ඒ සඳහා පරණ සමාජය බිඳ දමන්ට වෙනවා. ඉඩම් අයිතිය සම්ප්‍රදායිකව එක වර්ගයකට වෙන් කරල තියෙනව නම් එය බිඳ දැමීමත් ප්‍රජාතන්ත්‍රවාදයක්.

රුසියාව, චීනය වැනි රටවල කොමියුනිස්ට් පක්ෂ පාලනය යටතේ කිසිම දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුණේ නෑ. ඒත් කුළ ක්‍රම, වර්ග ක්‍රම, ජාතිවාද, ප්‍රවේණි ඉඩම් අයිතිය මේ ආදී දේවල් ඉතාම දරුණු ලෙස ඉවත් කරල තිබුණා. හැමෝටම සාමාන්‍ය අධ්‍යාපනය අනිවාර්ය කිරීම, ස්ත්‍රීන්ට රැකියා හා සම පඩි ලබා දීම, විවාහ නීතිය සම කිරීම මේ ආදී කරුණු සුළු දෙවල් නෙවෙයි. හුඟ දෙනෙක් පුදුම වෙනව චීනය මේ විදියට ධනපති සංවර්ධනය ඉහළ රේට්ටුවකින් ගෙනියන්නේ කොහොමද කියල.

මෙතැනදී කරුණු දෙකක් තියෙනවා. මං කිව්ව සමාජ ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණය නිසා සංවර්ධනය ගලා යාමට ඉඩක් ලැබිල තියෙනවා. අනෙක් අතට ඒකාධිපතිවාදි කොමියුනිස්ට් පාලනය නිසා ජනතාවට ඕනෑම අමරුකමක් පටවන්න පාලකයින්ට ඉඩ ලැබිල තියෙනවා. ඒ උඩ විරෝධයක් මතු වෙන්නේ ඉතා අමාරුවෙන් හා හෙමින්. කොහොම වුණත් දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය නැති වුණත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කටයුතු ඉටු වුණ රටක වෙළෙඳපොලක් අභ්‍යන්තරව ගොඩ නගා ගැනීමට යම් හැකියාවක් තිබෙන බව පිළිගන්න වෙනවා. ඒත් බහුජාතික සමාගම් තුළින් ඇතිවන සංවර්ධනය තුළින් ඒ විදියට සමාජය තුළ පරිභෝජනය වේගයෙන් ගොඩනැගෙන්නේ නෑ. චීනයේ දළ ජාතික නිෂ්පාදනය තවමත් යුරෝපයේ එංගලන්තය, ජර්මනිය, ප්‍රංශය වැනි රටවල්වලට වඩා පහළ. හුඟක් පහළ. ඒත් මේ රටවල්වලට වඩා දහ ගුණයක් විතර චීනයේ ජනගහනය වැඩියි. ඒ නිසා චීනයේ පරිභෝජනය ඉතා කුඩා පිරිසකට සීමා වෙනවා. අති විශාල පිරිසක් වෙළෙඳපොලට අඩමාන ලෙසයි සම්බන්ධ වෙන්නේ. ඉන්දියාවේ තත්ත්වය මීටත් වඩා බරපතලයි. මොකද? ඉංදියාව තුළ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය තිබුණත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඉතා දුර්වල පෙදෙස් විශාල වශයෙන් තිබෙනවා. ඉතාම දරුණු ලෙස කුලවාදය, වර්ගවාදය යටින් ක්‍රියාත්මක වෙනවා. බ්‍රාහ්මණවාදී මතවාදය ඉතාම බලවත්. ඒ නිසා වඩාත් දුර්වල විදියටයි වෙළෙඳපොල විකාශය වෙන්නේ. මේ නිසා ගෝලීය ධනවාදය විසින් පැරණි රටාවල් ශක්තිමත් කරන විලාශයක් තිබෙන්නේ. මොකද? මුළු ජනතාවගේ ඉදිරි ගමන ගැන නොසිතන නිසා.

මේ අනුව ගෝලීය ධනවාදී පාලකයින් හොඳට දන්නවා ඒකාධිපති පාලනයක් තිබුණත් නිලධාරී තන්ත්‍රයක් හොඳට ක්‍රියාත්මක වෙනව නම් ඒ රට තුළ තමන්ගේ ක්‍රමය මුදා හරින්න පුළුවන් බව. අනෙක් අතට කොමියුනිස්ට් පක්ෂයක් තිබුණත් එය ගෝලීය ධනවාදී සංවර්ධනයට අනුගත වෙනව නම් එයින් ලොකු ප්‍රයෝජනයක් ගන්න පුළුවන් කියලයි මේ බලවතුන් දැන් හොඳින් අවබෝධ කරගෙන ඉන්නේ. චීනයේ විතරක් නෙවෙයි ඉංදියාව තුළත් මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය පවා වැඩ කළේ පහළින් එන විරෝධයන් විසිරුවා හැර මේ ඊනියා සංවර්ධනයට අතහිත දෙන්න. ඒ නිසා ඒ තත්ත්වයන් තුළ සංවර්ධනය ඉදිරියට ගෙනයන්න ගෝලීය බලවතුන් ලෑස්තියි. මනුස්සකම නැතිව සංවර්ධනය ඉදිරියට ගෙනයන්න පුළුවන් කියල හිට්ලර් වුණත් පෙන්වල දීල තියෙනවා. එක් ජනතාවක් මරමරා තවත් ජනතාවකට දියුණුව ලබාදීමට ඉඩ තියෙනව කියල හිට්ලර් පෙන්වල දීපු එක අද වඩා සිවිල් පිට ගෝලීය බලවතුන් කරනව කිව්වොත් නිවැරදියි.

තාෂ්ණාවේ මෙහෙයුමෙන් සංවර්ධනය ගෙන යාම ගැන කථා කරන උදවිය හිට්ලර්ලා කළ දේ ගැන කථා කරන්නේ නැහැ. සංවර්ධනය ඇති කළ පළියට සමාජ පිරිහීම පිළිගන්න බෑනේ. ඉතා දරුණු සමාජ විනාශයක් සමඟ ලොකු සංවර්ධනයක් ඇති කරන්න පුළුවන් කියල ඉතිහාසය තුළ අත්දැකීම් තියෙනවා. මනුස්ස සමාජය ඉතාම දැනුවත්ව අවදි වෙලා යන සංවර්ධන ගමනක් ගැන හිතන්න නම් පංති සටන ගැන කථා කරන්නම වෙනවා. සමහර ධනපති විචාරකයෝ කියන්නේ පංති අරගලය පිළිගෙන වෙළෙඳපොල ආර්ථිකය ගොඩනැගිය යුතුයි කියලයි. වෙළෙඳපොල තුළ තරඟය වගේම දේශපාලන තරගයත් සමාජ කණ්ඩායම් අතර අරගලයන් විදහා දක්වනවා. ඒ නිසා ඒ තුළ තම සමාජ පංතියට දේශපාලන ඉඩක් ලබාගෙන වාසි අත්කර දීම සිදු විය යුතු බවයි මේ නූතන ධනපති විචාරකයෝ කියන්නේ. ඒ අනුව පංති සටන දේශපාලන රාමුවක් තුළ අනුගත කර ප්‍රතිසංස්කරණවලට යොමු කළ යුතුයි. මේ අනුව අමතුම ධනපති ක්‍රමයක් ඇති කිරීමට සැලසුම් දැමීම තුළ මේ උදවිය බලන්නේ ධනපති ක්‍රමය පෙරලා දැමීම වළක්වා ගැනීමයි.

**Master Tutoring**
"Your success is our satisfaction"
VCE
(Year 11 & 12)
"Helping Hands towards University"
English
Chemistry
Biology
Physics
Mathematics
(General Maths, Maths Methods, Specialist Maths)
Management
Accounting
Physiology, legal studies etc.
+
Year 6 to 10 (English, Maths, Science)
Special classes are available for Scholarship exams
Group & individual classes
(In Mill Park/Bundoora Institute)
Home Tutoring for all subjects
(all suburbs in Melbourne) also available
For more information :
Nihal Kodikara (B.Sc., M.Phil., MBA)
Contact: 0402474873 or 94041488
(Weekdays after 6PM, Weekends –Anytime)
E mail: mastertutoring@bigpond.com
Qualified, Experienced & committed Tutors in Melbourne
(5 full Scholarships per year are offered for children in families with financial hardship - Selection will be through Master Tutoring Management Team)
"Honestly and genuinely helping our sons and daughters"

**GATEWAY**
LAWYERS
- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

**Senanie Kurukularatne** LL.B
**Barrister & Solicitor**
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193
T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia